# ආර්ථික විද්‍යාව

## 5.5 ආදායම් ප්‍රවේශය



**නිපුණතා මට්ටම 5.5 :-** ආදායම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදනය ඇස්තමේන්තු කරන ආකාරය ආශ්‍රිත සංකල්ප විමසයි.

**අපේක්ෂිත ඉගෙනුම් පල**


1. දේශීය ආදායම් මූලාශ්‍රය විස්තර කරයි.
2. ශ්‍රී ලංකාවේ දළ දේශීය ආදායම් සංරචක දක්වයි.
3. ආදායම් ප්‍රවේශය ආශ්‍රිත සංකල්ප විස්තර කරයි.

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ආදායම් ප්‍රවේශය

නිෂ්පාදන ක්‍රියාවලියට දායක වීමේ දී ඒ සඳහා සහභාගී වන සියලු ම නිෂ්පාදන සාධක විසින් උපයා ගනු ලබන මුළු ආදායම් ප්‍රමාණය සැලකිල්ලට ගෙන ජාතික ගිණුම් සැකසීම ආදායම් ප්‍රවේශය ලෙස සැලකේ. (දළ දේශිය ආදායම) නිෂ්පාදන ක්‍රියාවලියේ දී බිහි වන ආදායම් මෙම ආදායම් ප්‍රවාහයේ වටිනාකම (y) නිෂ්පාදන ක්‍රියාවලිය මගින් බිහි කරන ලද භාණ්ඩ හා සේවා ප්‍රවාහයේ වටිනාකමට ( O) අනිවාර්යෙන් සමාන විය යුතු ය.




## 1.) සේවා නියුක්ති ආදායම

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ශ්‍රමය සැපයීම වෙනුවෙන් ලැබෙන ඉපැයීම් මීට ඇතුළත් වේ.

මෙම ඉපයීම් ප්‍රධාන කොටස් තුනකි.

- ශ්‍රමිකයන්ට ගෙවන වැටුප් හා වේතන (ප්‍රසාද දීමනා ,නිල ඇඳුම්,ආහාරපාන,නවාතැන්,ප්‍රවාහන පහසුකම්)
- සමාජ සංරක්ෂණ ක්‍රම සඳහා සේවා යෝජකයන් කරන ගෙවීම්.
- සේවා නියුක්තිකයන්ට ලැබෙන රක්ෂණ සේවා සෞඛ්‍ය පහසුකම් ආපදා දීමනා,කම්කරු වන්දි.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 2.) බදු කුලී ආදායම

මූර්ත දේපොළ හා ස්වාභාවික සම්පත් කුළියට දීමෙන් උපයනු ලබන කුලී ආදායම් වේ.

- නිශ්චල දේපොළ හා ස්වභාවික සම්පත් කුළියට දීමෙන් උපයන ලද කුළී ආදායම්.
- කුලී නිවාස සඳහා ලැබෙන බදු කුළී ආදායම්.
- අයිතිකරු පදිංචි වී සිටින නිවාස සඳහා ආරෝපිත බදු කුළී ආදායම්.
- බුද්ධිමය දේපල සඳහා ලැබෙන ආදායම(ප්‍රකාශන අයිතිය, ස්වාධිකාරය)

## 3.) ශුද්ධ පොළිය

ව්‍යාපාරික අංශය විසින් මූලා ප්‍රාග්ධනය භාවිත කිරිම වෙනුවෙන් එය සැපයූ පුද්ගලයින් වෙත කරනු ලබන ගෙවීම පොළියයි. මෙහි දී ශුද්ධ පොළිය ගණනය කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන්නේ එකතු කළ අගයන් බිහි කිරීමට දායක වන අරමුදල් සඳහා ගෙවන පොළී ආදායම් පමණි. කුටුම්භ අංශය තම ඉතුරුම් වෙනුවෙන් ලබන පොළිය හා ව්‍යාපාරික අංශය විසින් මූලා ප්‍රාග්ධනය භාවිත කිරීම වෙනුවෙන් මූලා ප්‍රාග්ධනය සැපයුම් කළ අය වෙත (බැංකු) කරනු ලබන ගෙවීම් එයට ඇතුළත් වේ.

සාම්ප්‍රදායික ව රාජ්‍ය ණය වෙනුවෙන් ගෙවනු ලබන සියලු ම පොළී සංක්‍රාම ගෙවීමක් වශයෙන් සලකා ජාතික ආදායම ගණනය කිරීමට ඇතුළත් නොකෙරේ.(ප්‍රාග්ධන වියදම් හා වර්තන වියදම් ලෙනිශ්චිත අසට දහසක් ලබා ගැනීමට ඇති අපහසුව නිසා) එසේ ම පාරිභෝගිකයන් තම පරිභෝජන කටයුතු සඳහා ලබාගත් ණය සඳහා ගෙවන පොලියත් ඇතුළත් නොවේ. ශුද්ධ පොළිය පමණක් ආදායමට ඇතුළත් කෙරේ.

ශුද්ධ පොළිය = නිෂ්පාදන අංශ ගෙවූ පොළී ආදායම - නිෂ්පාදන අංශයට ලැබුණු පොළී ආදායම




Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 4.) සමාගමික ලාභ

සමාගමක් ලෙස ලියාපදිංචි වූ ආයතන හිමිකරුවන් විසින් උපයනු ලබන ලාභ සමාගමික ලාභ නම් වේ. බදු අය කිරීමට ප්‍රථම මුළු ලාභය මෙහි දී සැලකිල්ලට ගනු ලබයි.

ලාභ හා ව්‍යවසායකත්ව ආදායම් ලෙස පහත මූලාශ්‍ර වැදගත් වේ ,

- සමාගම් ආදායම් බදු
- සමාගමික අයිතිකරුවන්ට ගෙවනු ලබන ලාභාංශ
- ව්‍යාපාර සතු රඳවා ගනු ලැබූ ලාභ හෙවත් නොබෙදූ ලාභ

ඉහත සඳහන් ලාභ මූලාශ්‍ර සියල්ල ම ජාතික ගිණුම් වලට සමාගමික ලාභ යටතේ ඇතුළත් කෙරේ.

## 5. ) ස්වයං රැකියා හා වෘත්තිකයන්ගේ ආදායම

සමාගම් වශයෙන් ලියාපදිංචි නොවූ කේවල ව්‍යාපාර,හවුල් ව්‍යාපාර,සමුපකාර ව්‍යාපාර,ගොවීන්, වෙනත් ස්වයං රැකියාවල නිරත විවිධ ශිල්පීන් හා වෘත්තිකයන් විසින් බිහි කරනු ලබන ආදායම් මෙයට ඇතුළත් වේ. තම අලෙවි ආදායමෙන් පිටතින් ලබා ගත් අනෙකුත් සියලු යෙදවුම් හා ක්ෂය වීම් සමග වැය කළ යුතු ගෙවීම් කළ පසු අවසානයේ ශේෂ වන ප්‍රමාණය ස්වයං රැකියා හා වෘත්තිකයන්ගේ ආදායමයි. එය මිශ්‍ර ආදායම් ලෙස සැලකේ.

ආර්ථික විද්‍යාත්මක න්‍යායන් අනුව දේශීය ආදායම් මූලාශ්‍රය ඉහත ආකාරයට දක්වා ඇති අතර එම සියලු සංරචකවල එකතුව දේශීය නිෂ්පාදිතය විසින් බිහි කරන ලද දළ දේශීය ආදායමයි.

Copyright © e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

SNA 2008 නව ජාතික ගිණුම්කරණ ප්‍රවේශයට අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය ආදායමේ සංරචක පහත ලෙසට වර්ග කර ඇත.

## ප්‍රාථමික ආදායම;

නිෂ්පාදන ක්‍රියාවලියේ නිරත වීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ නිෂ්පාදනයට අවශ්‍ය කරන වත්කම් හිමිකර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ ආයතනික ඒකක වලට ලැබෙන ආදායමයි.

## ප්‍රාථමික ආදායම් සංරචක ;-



1.) සේවක ආදායම්

2.) මෙහෙයුම් අතිරික්තය

3.) මිශ්‍ර ආදායම්

4.)ප්‍රාග්ධන පාරිභෝජන වියදම්

5.)රජය අය කර ගනු ලබන නිෂ්පාදනය මත අනෙකුත් බදු(එම සහනාධාර ඉවත් කළ)

## සේවක ආදායම් (CE)

සේවක ආදායම් යනු ශ්‍රමිකයන් විසින් ඉටු කරනු ලබන සේවාවන් සඳහා සේවා යෝජකයා විසින් මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ශ්‍රමිකයන් වෙත ලබා දෙන සියලු ම ප්‍රතිලාභයන් ය. සේවක ආදායම් පහත සංරචකවලින් සමන්විත ය.

- වැටුප් හා වේතන

  (ප්‍රසාද දීමනා,නිල ඇඳුම්,ආහාර පාන,නවාතැන්,ප්‍රවාහන පහසුකම් සඳහා දරන වියදම්)

- සමාජ ආරක්ෂණය,අර්ථසාධක අරමුදල් ,රක්ෂණ ක්‍රම,විශ්‍රාම අරමුදල් යනාදිය ට සේවා යෝජකයා විසින් ගෙවනු ලබන දායක මුදල්
- රෝගී තත්වයක දී හෝ විරැකියා තත්වයක දී හෝ විශ්‍රාම යන අවස්ථාවන්හි දී සේවා යෝජකයා විසින් සෘජුව ම සේවකයන් වෙත ගෙවනු ලබන ප්‍රතිලාභ

අන්තර්ගතය : - යූ.කේ.ඩී.ආර්.පී. ජයසිංහ මිය, වේල්ස් කුමරි විද්‍යාලය.මොරටුව/ඊ.එම්.එම්.එස්.ඩී. ගෝමස් මිය , ඩබ්.එම්.එම්. වීරසිංහ මිය, බප/ජය/ ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.
සැකසුම : - එස්.එච්. දිනූෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව 2017/2018.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : - ඩබ්ලිව්.ඊ.එම්.ඩී.ලලිත් සමන්ත විජේසිංහ මයා, විද්‍යෝදය විශ්ව විද්‍යා පීඨය,හොරණ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

# මෙහෙයුම් අතිරික්තය (OS)

සමාගමික අංශයේ ව්‍යවසායකයන් විසින් ජනනය කරන ආදායම හැඳින්වීමට යොදා ගැනේ. නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවාවල වටිනාකමෙන්, සියලු ම පිරිවැය හා ශුද්ධ බදු (සහනාධාර අඩු කළ බදු) අඩු කළ විට ලැබෙන ශේෂය ලෙස ද හැඳින්විය හැකි ය. මෙහි පොළිය, දළ ලාභය, බදු කුළිය ඇතුළත්ය.



මෙහෙයුම් අතිරික්තය = නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවාවල වටිනාකම - (සියලු ම පිරිවැය + ශුද්ධ බදු )
(OS)

මෙහෙයුම් අතිරික්තයේ ස්වරූප දෙකක් ඇත.

1.දළ මෙහෙයුම් අතිරික්තය

2.ශුද්ධ මෙහෙයුම් අතිරික්තය

## 1. දළ මෙහෙයුම් අතිරික්තය(GOS)

ව්‍යාපාරික ආයතනයේ එකතු කළ අගයෙන් සේවක ආදායම් අඩු කිරීමෙන් දළ මෙහෙයුම් අතිරික්තය ලැබේ.ශ්‍රමය හැරුණු කොට නිෂ්පාදන ක්‍රියාවලිය හරහා යොදා ගන්නා අනෙකුත් සියලු සාධක සඳහා ජනනය වන ආදායම් හෙවත් පොළිය , බදු කුළිය හා දළ ලාභවලින් සමන්විත දේපොළ ආදායම් ඇතුළත් වේ. ඒ අනුව **දේපොළ ආදායම** යනු නිෂ්පාදන ක්‍රියාවලියේ දී ජනනය වන මෙහෙයුම් අතිරික්තයයි.



දළ මෙහෙයුම් අතිරික්තය = ව්‍යාපාරික ආයතනයේ එකතු කළ අගය - සේවක ආදායම්
(GOS) (ΣGVA) (CE)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය : - යූ.කේ.ඩී.ආර්.පී. ජයසිංහ මිය, වේල්ස් කුමරි විද්‍යාලය.මොරටුව/ඊ.එම්.එම්.එස්.ඩී. ගෝමස් මිය , ඩබ්.එම්.එම්. වීරසිංහ මිය, බප/ජය/ ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.
සැකසුම : - එස්.එච්. දිනූෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව 2017/2018.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : - ඩබ්ලිව්.ඊ.එම්.ඩී.ලලිත් සමන්ත විජේසිංහ මයා, විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය,හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 2. ශුද්ධ මෙහෙයුම් අතිරික්තය(NOS)

දළ මෙහෙයුම් අතිරික්තයෙන් ස්ථාවර ප්‍රාග්ධන පාරිභෝජන වටිනාකම (CFC) (ක්ෂය වීම්) අඩු කිරීමෙන් ශුද්ධ මෙහෙයුම් අතිරික්තය ලැබේ. බොහෝ රටවල ස්ථාවර ප්‍රාග්ධන වත්කම් ක්ෂය වීම් පිළිබඳ දත්ත ලබාගැනීම දුෂ්කර බැවින් ශුද්ධ මෙහෙයුම් අතිරික්තය ගණනය කිරීමක් සිදු නොවේ.



| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | = | දළ මෙහෙයුම් අතිරික්තය | - | ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය |
|---|---|---|---|---|
| (NOS) | | (GOS) | | (CFC) |

### මිශ්‍ර ආදායම(MI)

කේවල ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ කුටුම්බ විසින් කරනු ලබන ව්‍යවසායක කටයුතු ආශ්‍රයෙන් ජනනය වන ආදායම් මිශ්‍ර ආදායම් ලෙස සැලකේ. (සමාගමික නොවන ව්‍යවසායකයන් ජනනය කරන ආදායම් වේ.)



මිශ්‍ර ආදායම් = ගෘහ ඒකක විසින් කරන ආර්ථික ක්‍රියාකාරකම් වලින් ලබන ඉපයීම් - (අතරමැදි පරිභෝජනය + සියලුම ශුද්ධ බදු + වැටුප් ලබන සේවක ගෙවීම්)

ස්ථාවර ප්‍රාග්ධන වත්කම් පාරිභෝජනය සඳහා ගැළපීම් කළ හැකිනම් එම අගය ශුද්ධ මිශ්‍ර ආදායමක් ලෙස නම් කළ හැකි ය.

**ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය**

නිෂ්පාදන ක්‍රියාවලියේ දී ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසම්පාදනය සඳහා දරන වියදම් වේ. මෙවා ක්ෂය වීම් වශයෙන් හඳුන්වයි.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

# නිෂ්පාදන මත වෙනත් බදු (t-s)

ජාතික ගිණුම්කරණයේ බදු වර්ගීකරණයට අනුව ප්‍රධාන බදු මූලාශ්‍ර දෙකකි.

නිෂ්පාදනය මත අයකරන බදු

ආදායම හා ධනය මත අය කරන බදු ( දේපොළ බදු )

ප්‍රාථමික ආදායම් සංරචකයේ ඇතුළත් නිෂ්පාදනය මත වෙනත් බදු යටතට ඒ අනුව ගැනෙනුයේ නිෂ්පාදනය මත අයකරන බදු පමණි.

එය කොටස් දෙකකි.

නිෂ්පාදනය මත බදු

භාණ්ඩ බදු

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය : - යූ.කේ.ඩී.ආර්.පී. ජයසිංහ මිය, වේල්ස් කුමරි විද්‍යාලය.මොරටුව/ඊ.එම්.එම්.එස්.ඩී. ගෝමස් මිය , ඩබ්.එම්.එම්. වීරසිංහ මිය, බප/ජය/ ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.
සැකසුම : - එස්.එච්. දිනූෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව 2017/2018.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : - ඩබ්ලිව්.ඊ.එම්.ඩී.ලලිත් සමන්ත විජේසිංහ මයා, විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය,හොරණ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 1.නිෂ්පාදනය මත බදු

නිෂ්පාදන ක්‍රියාවලියේ නිරත වීම වෙනුවෙන් නිෂ්පාදකයා රජයට කරන ගෙවීමකි.

උදා : ශ්‍රම බලය හෝ සේවක ගෙවීම මත අය කරන බදු

ස්ථාවර වත්කම් හිමිකම් දැරීම වෙනුවෙන් අය කරන බදු

බලපත්‍ර ගාස්තු

මුද්දර බදු , මුද්දර ගාස්තු

පරිසර දූෂණ බදු

එසේ ම නිෂ්පාදනය මත අනෙකුත් සහනාධාර ද දැකිය හැකිය.නිෂ්පාදකයන් තෝරා ගත් භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනයේ තවදුරටත් රඳවා තබා ගැනීම , දේශීය ළදරු කර්මාන්ත ආරක්ෂා කර ගැනීම ආදී විවිධ අරමුණු ඉටු කර ගැනීම සඳහා රජය විසින් නිෂ්පාදකයන්ට මූල්‍යාධාර ලබා දිය හැකි ය. නිෂ්පාදනය හේතුවෙන් පරිසරයට නිකුත්වන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වියදම් ලෙස හෝ දූෂිත වායු විමෝචනය වීමක් සිදු වන්නේ නම් එය අවම කිරීමට රජය දරනු ලබන වියදම් නිෂ්පාදනය මත අනෙකුත් සහනාධාර වේ.

ඒ අනුව නිෂ්පාදනය මත අය කරන අනෙකුත් බදු හා එවැනි සහනාධාර යන දෙවර්ගය එකට ගැළපීමෙන් නිෂ්පාදනය මත අනෙකුත් බදු ( එම සහනාධාරය ඉවත් කළ ) ( t-s) ලබාගත හැකි ය.

| | | | | |
|---|---|---|---|---|
| නිෂ්පාදනය මත අනෙකුත් බදු (එම සහනාධාර ඉවත් කළ) | = | නිෂ්පාදනය මත අය කරන අනෙකුත් බදු | - | නිෂ්පාදනය මත අනෙකුත් සහනාධාර |



Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 2. භාණ්ඩ බදු

භාණ්ඩ හා සේවා නිෂ්පාදනයෙන් පසු භාණ්ඩ ඒකකය පදනම් කරගෙන අය කරන බදු භාණ්ඩ බදුයි.

උදා : වැට් බදු

තීරු බදු ( ආනයන මත බදු , අපනයන මත බදු)

අලෙවි බදු

### ප්‍රාග්ධන පාරිභෝජන වියදම(CFC)

සලකා බලන කාල පරිච්ඡේදයක දී නිෂ්පාදකයන් විසින් නිෂ්පාදනය සඳහා භාවිත කරනු ලබන ස්ථාවර ප්‍රාග්ධන වත්කම් තොගයේ පවත්නා වටිනාකම නිෂ්පාදනයට යෙදවීම නිසා භෞතික ව හායනය වීම (ක්ෂය වීම)නිසා හෝ යල් පැන යාම නිසා හෝ අඩු වීම ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම ලෙස සැලකේ.

උදා : යන්ත්‍ර සූත්‍ර , ගොඩනැගිලි , උපකරණ

එම යන්ත්‍ර සූත්‍ර නැවත අලුත්වැඩියා කිරීමට ප්‍රතිසම්පාදන ලබා ගත යුතුයි.මෙලෙස නැවත මිලයට ගැනීමට දැරිය යුතු වියදම් ආදායමෙන් කොටසක් ලෙස වෙන් කර ප්‍රාග්ධන පරිභෝජන වියදම් ලෙස ගණනය කෙරේ.



අන්තර්ගතය : - යු.කේ.ඩී.ආර්.පී. ජයසිංහ මිය, වේල්ස් කුමරි විද්‍යාලය.මොරටුව/ඊ.එම්.එම්.එස්.ඩී. ගෝමස් මිය , ඩබ්.එම්.එම්. වීරසිංහ මිය, බප/ජය/ ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.
සැකසුම : - එස්.එච්. දිනුෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව 2017/2018.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : - ඩබ්ලිව්.ඊ.එම්.ඩී.ලලිත් සමන්ත විජේසිංහ මයා, විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය,හොරණ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## දළ දේශීය ආදායම ගණනය කිරීම

| අයිතමය | | පවත්නා වෙළෙඳපොළ අනුව (රුපියල් මිලියන) |
|---|---|---|
| 1. සේවක ආදායම | | 3000 |
| 2.දළ මෙහෙයුම් අතිරික්තය | | 5000 |
| 2.1 ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 2000 | |
| 2.2 මිශ්‍ර ආදායම | 2500 | |
| 2.3 ස්ථාවර ප්‍රාග්ධන පාරිභෝජනය | 500 | |
| 3.නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළ පසු එම සහනාධාර) | | 100 |
| 4. මූලික මිලට සමස්ත එකතු කළ අගය | | 8100 |
| 5. භාණ්ඩ හා සේවා මත අය ශුද්ධ කරන බදු (අඩු කළ පසු එම සහනාධාර) | | 900 |
| 6.වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය / දළ දේශීය ආදායම | | 9000 |



අන්තර්ගතය : - යූ.කේ.ඩී.ආර්.පී. ජයසිංහ මිය, වේල්ස් කුමරි විද්‍යාලය.මොරටුව/ඊ.එම්.එම්.එස්.ඩී. ගෝමස් මිය , ඩබ්.එම්.එම්. වීරසිංහ මිය, බප/ජය/ ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.
සැකසුම : - එස්.එච්. දිනූෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව 2017/2018.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : - ඩබ්ලිව්.ඊ.එම්.ඩී.ලලිත් සමන්ත විජේසිංහ මයා, විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය,හොරණ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

**ආදායම් ප්‍රවේශය ආශ්‍රිත සංකල්ප**

## ප්‍රාථමික ආදායම

නිෂ්පාදන ක්‍රියාවලියේ නිරත වීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ නිෂ්පාදනයට අවශ්‍ය කෙරෙන වත්කම් හිමි කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ ආයතනික ඒකකවලට ලැබෙන ආදායමයි. මෙහි සංරචක හතරකි.

1. සේවක ආදායම(CE)
2. දළ මෙහෙයුම් අතිරික්තය(OS)
3. මිශ්‍ර ආදායම(MI)
4. නිෂ්පාදනය හා ආදායම මත ශුද්ධ බදු (t-s)

GVA=Σ[CE+OS+MI+t-s]

GDP=GVA + ශුද්ධ වක්‍ර බදු

## දළ දේශීය ආදායම

යම්කිසි කාල පරිච්ඡේදයක ආර්ථිකයේ ක්‍රියාවලියට සහභාගීවන්නන්ගේ සියලු නිෂ්පාදන සාධකවලට ලැබෙන ආදායම්වලට ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය (CFC) එකතු කිරීමෙන් දළ දේශීය ආදායම ලැබේ.

GDI=GVA+CFC

අන්තර්ගතය : - යූ.කේ.ඩී.ආර්.පී. ජයසිංහ මිය, වේල්ස් කුමරි විද්‍යාලය.මොරටුව/ඊ.එම්.එම්.එස්.ඩී. ගෝමස් මිය , ඩබ්.එම්.එම්. වීරසිංහ මිය, බප/ජය/ ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.
සැකසුම : - එස්.එච්. දිනූෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව 2017/2018.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : - ඩබ්ලිව්.ඊ.එම්.ඩී.ලලිත් සමන්ත විජේසිංහ මයා, විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය,හොරණ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

**ශුද්ධ දේශීය ආදායම**

දළ දේශීය ආදායම තුළින් ස්ථාවර ප්‍රාග්ධන පාරිභෝජනය ඉවත් කළ විට ශුද්ධ දේශීය ආදායම ලැබේ.

NDI=GDI-CFC

**දළ ජාතික ආදායම**

දළ දේශීය ආදායමට ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම් ගැළපූ විට ලැබෙන්නේ දළ ජාතික ආදායමයි.

GNI = GDI+ ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම

**ශුද්ධ ජාතික ආදායම**

දළ ජාතික ආදායමෙන් ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය ඉවත් කළ විට ලැබෙන්නේ ශුද්ධ ජාතික ආදායමයි.

NNI = GNI - CFC

**වැය කළ හැකි ජාතික ආදායම (GNDI)**

දළ ජාතික ආදායමට ශුද්ධ විදේශ ජංගම සංක්‍රාම ගැළපූ විට වැය කළ හැකි ජාතික ආදායම ලැබේ.

වැය කළ හැකි ජාතික ආදායම = GNI + ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම

ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම = (විදේශ ද්විතියික ආදායම් ලැබීම් - විදේශ ද්විතියික ආදායම් ගෙවීම්)


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## කුටුම්බ ආදායම (පෞද්ගලික ආදායම)

ජාතික ආදායමෙන් කුටුම්බ වෙත නොලැබෙන ආදායම් ඉවත් කර ,ජාතික ආදායමට ඇතුළත් නොවූ කුටුම්බ වෙත ලැබෙන ආදායම් එකතු කිරීමෙන් ලැබෙන්නේ කුටුම්බ ආදායමයි.

කුටුම්බ ආදායම = GNI - කුටුම්බවලට නොලැබෙන ආදායම් + කුටුම්බවලට ලැබෙන ආදායම් (පෞද්ගලික සංක්‍රාම)

කුටුම්බවලට නොලැබෙන ආදායම්: නොබෙදූ ලාභ,සමාගමික බදු, ප්‍රාග්ධන පරිභෝජනය,සමාජ සංරක්ෂණ දායක මුදල්

පෞද්ගලික සංක්‍රාම: විශ්‍රාම වැටුප්,ශුද්ධ විදේශ පෞද්ගලික ද්වීතික ආදායම්,රාජ්‍ය ණය සඳහා කුටුම්බ වලට ලැබෙන පොළී,කුටුම්බ වලට ලැබෙන වෙනත් සහනාධාර (පාසල් නිළ ඇඳුම්,පොත්)

## වැය කළ හැකි කුටුම්බ / පෞද්ගලික ආදායම

කුටුම්බ ආදායමෙන් සත්‍ය ලෙසට ම භාණ්ඩ හා සේවා සඳහා වැය කිරීමට ඔවුන් වෙත ඉතිරි වන ආදායම වැය කළ හැකි කුටුම්බ ආදායමයි. එනම් පෞද්ගලික බදු (සෘජු බදු ) (ආදායම් බදු ,දේපොළ බදු, ත්‍යාග බදු, උරුම බදු) ගෙවූ පසු ඉතිරි වන ආදායමයි.



වැය කළ හැකි කුටුම්බ ආදායම = කුටුම්බ ආදායම - පෞද්ගලික බදු

වැය කළ හැකි කුටුම්බ ආදායම = පෞද්ගලික පරිභෝජන වියදම + පෞද්ගලික ඉතුරුම්


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## මූර්ත ජාතික ආදායම

ස්ථාවර මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතයට වෙළෙඳ අනුපාතයේ වෙනස් වීම මගින් රටකට හිමිකර ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය කොපමණද යන්න අවබෝධ කර ගැනීමට මූර්ත ජාතික ආදායම යන සංකල්පය ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වා දී ඇත.

ඒ අනුව මූර්ත ජාතික ආදායම යන සංකල්පයෙන් දැක්වෙන්නේ නිෂ්පාදන ක්‍රියාවලියෙන් හා අන්තර්ජාතික හුවමාරුවෙන් රටකට ලබා ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය කොපමණද යන්නයි. එම නිසා මූර්ත ජාතික ආදායම ගණනය කිරීමේ දී ස්ථාවර මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතයට හෝ ආදායමට අපනයනවල මූර්ත වටිනාකම හෙවත් ක්‍රය ශක්තිය එකතු කළ යුතු ය.



මූර්ත ජාතික ආදායම = ස්ථාවර මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය/ ආදායම + අපනයනවල ක්‍රය ශක්තිය - ස්ථාවර මිලට ඇස්තමේන්තු කරන ලද අපනයන වටිනාකම



මූර්ත ජාතික ආදායම = ස්ථාවර මිලට දළ ජාතික නිෂ්පාදිතය $+(x/p_m - x/p_x)$

x=අපනයන වටිනාකම

Pm=ආනයන මිල දර්ශකය

Px=අපනයන මිල දර්ශකය

අන්තර්ගතය : - යූ.කේ.ඩී.ආර්.පී. ජයසිංහ මිය, වේල්ස් කුමරි විද්‍යාලය.මොරටුව/ඊ.එම්.එම්.එස්.ඩී. ගෝමස් මිය , ඩබ්.එම්.එම්. වීරසිංහ මිය, බප/ ජය/ ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.
සැකසුම : - එස්.එච්. දිනූෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව 2017/2018.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : - ඩබ්ලිව්.ඊ.එම්.ඩී.ලලිත් සමන්ත විජේසිංහ මයා, විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය,හොරණ
Copyright © www.e-thaksalawa.moe.gov.lk